# අන්තර් පාරිවේණික භාෂා හා සාහිත්‍ය තරග - 2019

අධ්‍යාපන අමාත්‍යාංශය - පිරිවෙන් අධ්‍යාපන ශාඛාව

බුද්ධි පරීක්ෂණ (ප්‍රාථමික)  දිස්ත්‍රික් තරග වටය

විභාග අංකය - ..........................  කාලය - පැය 2 යි.

❖ 01 සිට 40 තෙක් ප්‍රශ්නවල නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

(1) විසිපන්දහස් අටසිය හිස් පස යන සංඛ්‍යාවේ ඉලක්කම් අග සිට මුලට ලියූ විට ලැබෙන සංඛ්‍යාව කුමක්ද?

1) 53825  2) 35852  3) 53852  4) 85532

(2) ඔරලෝසුවක පැය කටුවත්, මිනිත්තු කටුවත් සෘජු කෝණයක් ඇතිව පිහිටන අවස්ථා දෙකක වේලාවල් දක්වෙන පිළිතුර කුමක්ද?


1) ~~6.15 සහ 12.15~~  2) 3.00 සහ 9.00  3) 3.30 සහ 9.30  4) 12.00 සහ 6.00

(3) හිස්තැන්වලට සුදුසු සංඛ්‍යා දෙක වන්නේ

| | | | |
|---|---|---|---|
| 2 | 3 | 1 | 6 |
| 4 | — | 3 | 24 |
| 2 | 3 | — | 30 |
| 16 | 18 | 15 | |

1) 5.3  2) 2.5  3) 3.2  4) 2.2

(4) රූපයේ A,B සහ C යන වෘත්ත එකිනෙකට සමානය. එහි අඳුරු කළ කොටසේ වර්ගඵලය වර්ග සෙන්ටිමීටර 12 කි. මුළු රූපයේ වර්ගඵලය පිළිබඳ නිවැරදි ප්‍රකාශය කුමක්ද?




1) වර්ගසෙන්ටිමීටර 72 ට අඩුය.
2) වර්ගසෙන්ටිමීටර 72
3) වර්ගසෙන්ටිමීටර 72 ට වැඩිය.
4) අදහසක් කිව නොහැකිය.

(5) රෝගියෙකුට A,B සහ C නම් බෙහෙත් පෙති 3ක් ඇත. A පෙත්ත පැය 2 කට වරක්ද, B පෙත්ත පැය 3කට වරක්ද, C පෙත්ත පැය 4 කට වරක්ද, ගත යුතුයි. උදෑසන 6.00 ට මෙම පෙති 3ම එකවර ගත්තේ නම් නැවත පෙති 3ම එකවර ගන්නේ කීයටද?

1) දවල් 12.00  2) සවස 6.00  3) රාත්‍රී 8.00  4) රාත්‍රී 10.00

(6) පහත දී ඇති සංඛ්‍යා වල රටාවක් ඇති වීම සඳහා ඉවත් කළ යුතු සංඛ්‍යා දෙක තෝරන්න.

30, 28, 25, 20, 17, 15, 10

1) 25 සහ 20  2) 17 සහ 15  3) 28 සහ 17  4) 30 සහ 10


(7) ප්‍රියාන් සනත්ට පෙර ක්‍රීඩා පිටියකට පැමිණි අතර සනත්ට පසුව ක්‍රීඩා පිටියෙන් ඉවත් විය. උපුල්, සනත්ට පසුව ක්‍රීඩා පිටියට පැමිණි අතර, ප්‍රියාන්ට පෙර ක්‍රීඩා පිටියෙන් ඉවත් විය. වැඩිම කාලයක් ක්‍රීඩා පිටියේ රැඳී සිටියේ කවුද?

1) උපුල්  2) ප්‍රියාන්  3) සනත්  4) නිශ්චිතව කිව නොහැකිය

(8) ලසිතගේ දැන් වයස අවුරුදු 16 කි. ඔහු ඔහුගේ සහෝදරයා මෙන් හතර ගුණයක් වයස වේ. ලසිත ඔහුගේ සහෝදරයා මෙන් දෙගුණයක් වයස් වන්නේ තව අවුරුදු කීයකින්ද?


1) 6  2) 8  3) 10  4) 12

1 පහත සඳහන් රූපවල ඇති සංඛ්‍යා රටා හඳුනාගෙන හිස්තැනට සුදුසු සංඛ්‍යාව සොයන්න.




1) 72     2) 80     3) 100     4) 120

පහත රූපයේ දක්වෙන පැති හය A,B,C,D,E සහ F ලෙස සලකුණු කර ඇති එකම දාදු කැටයක පිහිටීම් 3 කි.





ඉහත දාදු කැටයේ D අක්ෂරය සලකුණු කර ඇති පැත්තට ප්‍රතිවිරුද්ධ පැත්තේ දක්වෙන අක්ෂරය කුමක්ද?

1) B     2) A     3) E     4) F

ආසන්න 100 ට වටැයූ විට 1000 ලෙස ලැබෙන විශාලම සංඛ්‍යාව වන්නේ

1) 99     2) 999     3) 1049     4) 1499

කුඩා ඝනක කිහිපයක් එක මත එක තබා ඇති ආකාරය පහත රූපයේ දක්වේ. මෙහි මුහුණු 2 ක් පමණක් බාහිරට විවෘතව ඇති ඝනක සංඛ්‍යාව කීයද?



1) 12     2) 16     3) 20     4) 24

දුර දිවීමේ තරඟයකදී ළමයින් 5 දෙනෙකු තරඟය නිම කිරීමට ගතවන කාලය පහත දක්වේ.

කුමාර - මිනිත්තු 6
ගයාන් - මිනිත්තු 9
ප්‍රියාල් - තරඟය නිම කළේ නැත.
සුපුන් - මිනිත්තු 5
උදය - මිනිත්තු 7

ඔවුන් ජය කණුව කරා ළඟා වූ අනුපිළිවෙල කුමක්ද?

1) සුපුන්, කුමාර, උදය, ගයාන්
2) ප්‍රියාල්, ගයාන්, උදය, කුමාර, සුපුන්
3) ගයාන්, උදය, කුමාර, සුපුන්
4) [illegible]


(22) දී ඇති තොරතුරු අනුව හලාවත සිට අනුරාධපුරයට දුර කොපමණද?




| සිට | තෙක් | දුර km |
|---|---|---|
| කොළඹ | හලාවත | 76 km |
| කොළඹ | පුත්තලම | 142 km |
| පුත්තලම | අනුරාධපුරය | 72 km |
| | | |

1) 148 km 2) 138 km 3) 214 km 4) 70 km

(23) දී ඇති රූප දෙක සම්බන්ධ කළ විට ලැබෙන රූපය කුමක්ද?




(24) 5(3+2) - 6 ÷ 3 x 2 හි පිළිතුර වන්නේ කුමක්ද?

1) 6 2) 20 3) 21 4) 24

(25) රථ 2 ක් A නගරයේ සිට B නගරයට යාමට A නගරයෙන් එකම මොහොතක ගමන අරඹයි. එක් රථයක වේගය $36kmh^{-1}$ හා අනෙක් රථයේ වේගය $40kmh^{-1}$ නම් පැය 2කට පසු රථ දෙක අතර පරතරය කොපමණද?

1) 4 km 2) 8 km 3) 12 km 4) 36 km

(26) සාධාරණ පදය වන $\frac{n(n+1)}{2}$ සංඛ්‍යා රටාවේ 5 වෙනි සහ 6 වෙනි පද පිළිවෙලින් දක්වෙන පිළිතුර තෝරන්න.

1) 15,21 2) 21,22 3) 21,28 4) 36,45

(27) පැත්තක දිග 12 බැගින් වූ සමචතුරස්‍ර හැඩැති ඉඩමක මීටර දෙකෙන් දෙකට කම්බි කණු සිටුවා ඇත. ඉඩමට පිටතින් සිට බැලූ විට එක් පැත්තකින් පෙනෙන කම්බි කණු ගණන කොපමණද?

1) 5 2) 6 3) 7 4) 8

(28) 25cm බැගින් දිග කම්බි කූරු 4ක්, තනි කම්බියක් වනසේ පාස්සා ගන්නා ලදී. සෑම පැස්සුමකදී ම එක් එක් කම්බියෙන් 5cm බැගින් එක මත එක තැබීමට සිදුවිය. අවසානයට ලැබෙන කම්බියේ දිග කොපමණ

1) 80cm 2) 85cm 3) 90cm 4) 95cm

(29) එක්තරා මෝටර් රථයක් ඉන්ධන ලීටරයකින් කිලෝමීටර් 12 ක් ධාවනය කළ හැකිය. ඉන්ධන ලීටරයක මිල රු.120 නම් කිලෝමීටර් 66 ක් ධාවනය කිරීමට අවශ්‍ය ඉන්ධන සඳහා වැයවන මුදල කොපමණද?


1) රු. 600, 2) රු. 630 3) රු. 660 4) රු. 800

(30) 'සාමිණී' විද්‍යාලයේ උසස් පෙළ සිසුන් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

ξ = {උසස්පෙළ සිසුන්}

A = {උසස්පෙළ ගණිත සිසුන්}

B = {උසස්පෙළ විද්‍යා අංශයේ සිසුන්}




~~... සාමිණී විද්‍යාලයේ උසස්පෙළ විද්‍යා අංශයේ ... සිසුන් ගණන කොපමණද?~~

1) 38 2) 22 3) 21 4) 17


(31) 10 සිට 100 තෙක් සංඛ්‍යා ලිවීමේදී 2 ඉලක්කම යෙදෙන වාර ගණන කොපමණද?

1) 10 2) 18 3) 19 4) 20

(32) 2, 3 සහ 5 යන සංඛ්‍යා වලින් බෙදූ විට 1 ක් ඉතිරිවන කුඩාම සංඛ්‍යාව කුමක්ද?

1) 11 2) 25 3) 31 4) 61

(33) මෙම රූපයට අනුව කළ හැකි උපරිම ත්‍රිකෝණ සංඛ්‍යාව කීයද?



1) 4 2) 5 3) 6 4) 8

(34) ත්‍රිකෝණයක තිබිය හැකි අවම සුළුකෝණ ගණනත් උපරිම සුළුකෝණ ගණනත් වන ... ගැලපේ.

1) 1,3 2) 2,2 3) 2,1 4) 2,3


(35) ඉලක්කම් 4 කින් යුත් සංඛ්‍යාවක් සිතමු. එම සංඛ්‍යාවේ,

- දහස්ථානයේ ඉලක්කම, එකස්ථානයේ ඉලක්කමෙන් පස් ගුණයකි.
- සියස්ථානයේ ඉලක්කම, දසස්ථානයේ ඉලක්කමෙන් හතර ගුණයකි.

එම සංඛ්‍යාව පහත දී ඇති සංඛ්‍යා අතරින් කුමක් විය හැකිද?

1) 5421 2) 4512 3) 15621 4) 5821

(36) එක සමාන චතුරස්‍ර හැඩ 5 ක් ඇති පහත රූපයේ පරිමිතිය 180cm කි. එහි එක් සමචතුරස්‍රයක වර්ගඵලය වර්ගසෙන්ටිමීටර කොපමණද?



1) 144　　2) 36　　3) 225　　4) 400

(37) නිවසක රූපවාහිනිය පෙ.ව. 10.00 සිට ප.ව. 12.15 දක්වාද, පරිගණකය පෙ.ව. 11.15 සිට ප.ව. 12.30 දක්වා ද විදුලි යකඩය පෙ.ව. 11.30 සිට ප.ව. 12.45 දක්වා ද ක්‍රියාත්මක විය. විදුලි උපකරණ තුනම එක විට ක්‍රියාත්මක වූ කාලය වන්නේ,

1) මිනිත්තු 30 කි.　　2) මිනිත්තු 45 යි


3) පැය 1යි.　　4) පැය 1 යි මිනිත්තු 15 යි.

(38) සෘජුකෝණී ත්‍රිකෝණයක පාද 3 හි දිග විය හැකි පිළිතුර කුමක්ද?

1) 1cm, 2cm, 3cm　　2) 3cm, 4cm, 6cm

3) 6cm, 8cm, 10cm　　4) 6cm, 8cm, 12cm

(39) රූපයේ දක්වෙන ඝන වස්තුවේ මුහුණත් ගණන කොපමණද?



1) 8　　2) 9　　3) 10　　4) 11

(40) රු. 720 ට විකිණීමෙන් 10% ක අලාභයක් සිදුවන භාණ්ඩයක් 10% ක ලාභයක් ලැබීමට නම් විකිණිය යුතු මිල කොපමණද?

1) රු. 800　　2) රු. 840　　3) රු. 880　　4) රු. 900